| | | |
|---|---|---|
| ආයතනයේ නම | : | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක | : | 489 |

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

| | | |
|---|---|---|
| நிறுவனத்தின் பெயர் | : | தொகை மதிப்பு மற்றும் புள்ளிவிபரவியல் திணைக்களம் |
| பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் | : | 489 |

பாராளுமன்ற பொது கணக்கு குழுவால் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பாக கௌரவ நிதிஇ திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்களால் நிலையியல் கட்டளை இலக்கம் 119(4)-இன் கீழ் எடுக்கப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகள் சமர்ப்பிப்பு

| | | |
|---|---|---|
| Name of the Institution | : | Department of Census and Statistics |
| Parliamentary Series | : | 489 |

Submission of the observations and measures taken by Hon. Minister of Finance, Planning and Economic Development under Standing Order No. 119(4) regarding the report tabled by the Committee on Public Accounts of Parliament, to the Parliament

# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: MF06/10//PS/489
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.06.08

ගරු පාර්ලිමේන්තුවේ සභානායකතුමා මගින්
ගරු පාර්ලිමේන්තුවේ කථානායකතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

**<u>අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අදාළව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.</u>**
**<u>පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 489 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ නව සංශෝධිත පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 119(4) අනුව රජයේ ගිණුම් කාරක සභාව විසින් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල කටයුතු විමර්ශනය කිරීමෙන් අනතුරුව එම කමිටුව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවේ සඳහන් නිරීක්ෂණ/නිර්දේශ/නියෝග සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

ඒ අනුව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරය තුල දී රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් විමර්ශනයට ලක් කරන ලද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පිළිබඳ විමර්ශනය පදනම් කරගෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සම්පාදිත වාර්තාව පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 489 හි අන්තර්ගත වේ. ඒ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සම්පාදිත වාර්තාවේ අන්තර්ගත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අදාලවන නිර්දේශ සම්බන්ධයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති බව ගරු පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කරමි.

අනුර කුමාර දිසානායක
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 489

දෙපාර්තමේන්තුවේ නම : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

| අංකය | වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනා ගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 1. | ජන හා නිවාස සංගණනය -2021 වර්ෂය | ජන හා නිවාස සංගණනයේ සංගණන දිනය ලෙස 2024.12.19 දින ප්‍රකාශයට පත් කර තිබූ අතර, ඒ අනුව ගණන් ගැනීමේ අදියරට අදාළ ක්ෂේත්‍ර කටයුතු මුළු දිවයිනම ආවරණය වන පරිදි සාර්ථකව අවසන් කරන ලදී.<br>ඒ අනුව,<br><br>**01. ජන හා නිවාස සංගණනයේ මූලික වාර්තාව**<br><br>**2025.03.24 දින - ජන හා නිවාස සංගණනයේ මූලික වාර්තාව** ප්‍රකාශයට පත් කර අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගන්වන ලදී. තවද, එම මූලික වාර්තාව දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇති අතර, එහි මුද්‍රිත පිටපත් දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ට ද ලබා දෙන ලදී.<br><br>**02. ජනගහනය පිළිබඳ මූලික තොරතුරු හා නිවාස පිළිබඳ මූලික තොරතුරු**<br><br>2025.10.30 දින - (1) ජනගහනය පිළිබඳ මූලික තොරතුරු (දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව)<br><br>(2) නිවාස පිළිබඳ මූලික තොරතුරු (දිස්ත්‍රික්ක හා ප්‍රා දේශීය ලේකම් කොට්ඨාස අනුව)<br><br>යන වාර්තා දෙක ප්‍රකාශයට පත් කරන ලදී.<br><br>භාෂා ත්‍රිත්වයෙන් සකස් කරන ලද එම වාර්තා, ප්‍රකාශයට පත් කළ දිනම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කර ඇත. තවද, එම වාර්තාවලට අදාළ සියලු දත්ත වගු PDF සහ Excel දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත. මෙම සංගණන තොරතුරු ඇසුරින් දිට්වා සුළි කුණාටුවෙන් ඇතිවූ ආපදා තත්වය කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය දත්ත වගු සහ සිතියම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලදී.<br><br>මෙම වාර්තා නිකුත් කිරීමට සමගාමීව, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මෙන්ම ජනමාධ්‍යවේදීන් ද දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.<br><br>**03. ජන හා නිවාස සංගණනයේ අවසන් වාර්තාව**<br><br>**2026.03.20 දින - ජන හා නිවාස සංගණනයේ අවසන් වාර්තාව** පළකරන ලද අතර, එය 2026.04.06 දින **ජනාධිපති ලේකම් කාර්යාලයේදී අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගන්වන ලදී.** 2026.04.10 දින අවසන් වාර්තාවේ අඩංගු තොරතුරු එළිදැක්වීම හා දත්ත භාවිතා කරන්නන් හා ජනමාධ්‍යවේදීන් |

| | | |
|---|---|---|
| | | දැනුවත් කිරීමේ වැඩසටහන සිදු කරන ලදී. සංගණන තොරතුරු ඇතුලත් දත්ත පුවරුවක් සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කිරීමත් එදින සිදු කළ අතර ඒ සම්බන්ධයෙන් ද අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. මෙම වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් ම සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කර ඇත. |
| 2. | <u>ජන හා නිවාස සංගණනය -2021 වර්ෂය, ආර්ථික සංගණය, ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය (HIES) හා ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය (DHS) නොපැවැත්වීම</u> | ජන හා නිවාස සංගණනය මඟින් රැස් කරන ලද දත්ත පදනම් කර ගනිමින්, 2024 දෙසැම්බර් 30 වන විට ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සඳහා අවශ්‍ය නියැදි සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබා දී ඇත.<br><br>ඒ අනුව, ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2025 ජනවාරි මාසයේ සිට ආරම්භ කරන ලදී. එම සමීක්ෂණයේ ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම වසරක් පුරාවටම සිදුවන අතර 2026 ජනවාරි මාසයේදී අවසන් කරන ලදී. මේ වන විටඑම දත්ත පරිගණකගත කිරීම, සංස්කරණය කටයුතු සිදු කරන අතර අවසන් වාර්තාව 2026 ඔක්තෝබර් මාසයේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. |
| 3. | <u>"ඊ ග්‍රාම නිලධාරි " ව්‍යාපෘතිය (e-GN Project)</u><br>ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජන හා නිවාස සංගණනයට අදාළ දත්ත රැස් කිරීමේ ආකෘති පත්‍රය මගින් රැස් කරනු ලබන සියලු දත්ත, "ඊ - ග්‍රාම නිලධාරී" ව්‍යාපෘතිය (e – GN Project) සඳහා ග්‍රාම නිලධාරී වරුන් විසින් ද වෙනත් ආකෘති පත්‍රයක් භාවතයෙන් රැස් කරනු ලබන බවත් , ජන හා නිවාස සංගනනයට රැස් කරනු ලබන දත්ත වලට අමතරව"ඉ-ග්‍රාම නිලධාරී" ව්‍යාපෘතිය සහා අමතර ද්තත සුලු ප්‍රමාණයක් පමණක් ග්‍රාම නිලධාරී වරුන් විසින් රැස් කරනු ලබන බවත් අනාවරණය විය. | ජන හා නිවාස සංගණනය පවත්වනු ලබන්නේ සංගණන ආඥාපනතේ විධිවිධාන යටතේය. ඒ අනුව, සංගණන ආඥාපනතට අනුකූලව,අදාළ පාර්ශවයන්ගේ ඉල්ලීම පරිදි, ඊ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය සඳහා ජන හා නිවාස සංගණන දත්ත ලබා දීමේ හැකියාව පවතී.<br><br>"ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන සංවර්ධනය පිළිබඳ ක්‍රමෝපාය" සකස් කිරීමේ කටයුතු හා සංඛ්‍යාලේඛන පනත සකස් කිරීමේ කටයුතු අදාළ ආයතන සම්බන්ධිකරණය කරමින් සිදුකරමින් පවතී. |
| 4. | <u>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සැලැස්ම 2016-2025</u> | ජන හා නිවාස සංගනනය 2021 CAPI තාක්ෂණය භාවිතයෙන් ටැබ් පරිගණක යොදාගෙන සාර්ථකව සිදු කරන ලද අතර ඉදිරියේදී සිදු කරනු ලබන ආර්ථික සංගණනය (කෘෂි කාර්මික කටයුතු) හා ආර්ථික සංගණනය (කෘෂි කාර්මික නොවන කටයුතු) ඇතුලු අනෙකුත් සංගණනයන්CAPI තාක්ෂණය මගින් ටැබ් පරිගණක භාවිතයෙන් සිදු කිරීමට සැලසුම් කර ඇත.ඉදිරියේදී සිදු කරනු ලබන බොහෝ සමීක්ෂණ වල දත්ත රැස් කිරීමේ මෙම CAPI තාක්ෂණය මගින් සිදු කිරීමට අපේක්ෂිතය. |
| 5. | <u>ඒක පුද්ගල, ගෘහ ඒකක වියදම</u> | 2019 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට (HIES) අනුව, සාමාන්‍ය මාසික ඒක පුද්ගල ගෘහ ඒකක වියදම රු.17,000 ක් පමණ වේ. සෑම වසර තුනකටම වරක් මෙම සමීක්ෂණය පැවැත්වීමට නියමිත අතර, 2021 ජන හා නිවාස සංගණනය පැවැත්වීමෙන් පසු එම නව සංගණන රාමුව භාවිතා කරමින් 2022 වර්ෂයේ දී HIES සමීක්ෂණය පැවැත්වීමට නියමිතව තිබුණි. නමුත් ජන හා නිවාස සංගණනය පවත්වා අවසන් වූයේ 2024 වර්ෂයේ බැවින් එම නව රාමුව භාවිත කර ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සිදු කරන ලද්දේ 2025 වර්ෂයේදීය. මේ වන විට එහි දත්ත වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ කටයුතු හා දත්ත සැකසුම් කටයුතු සිදු කරමින් පවතී.<br><br>එබැවින් 2019 වසරේ සාමන්‍ය මාසික ඒක පුද්ගල ගෘහ ඒකක වියදම, |

<table>
<tr>
<td></td>
<td></td>
<td>ජාතික පාරිභෝගික මිල දර්ශකයට අනුව මිල ගණන් වෙනස් වීම මත ගැළපීම් කර (උද්ධමනයට අනුව ගළපා) 2021 වසරේ සිට 2025 වසර දක්වා ඇස්තමේන්තු කරන ලද අගයන් පහත වගුවේ දක්වා ඇත.<br><br>
<table>
<tr><th>වර්ෂය</th><th>HIES* 2019</th><th>2021</th><th>2022</th><th>2023</th><th>2024</th><th>2025</th></tr>
<tr><td>ඇස්තමේන්තු ගත සාමාන්‍ය මාසික ඒක පුද්ගල ගෘහ ඒකක වියදම- රුපියල්</td><td>17,000</td><td>19,000</td><td>34,000</td><td>39,000</td><td>40,000</td><td>41,000</td></tr>
</table>
<br>* HIES - Household Income and Expenditures Survey<br><br>
තව ද ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන 2026 අයවැය මගින් වෙන් වී ඇති අතර මෙම වර්ෂයේදී එම සමීක්ෂණය පැවැත්වීමට අවශ්‍ය සැලසුම් සිදු කරමින් සිටී.</td>
</tr>
<tr>
<td>6.</td>
<td><u>ලෝක බැංකු ආධාර හා රජයේ අරමුදල් වැයකර දෙපාර්තමේන්තුව සඳහා 2015 වර්ෂයේ මහල් 12කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකර එහි කාර්යාල කටයුතු ආරම්භ කර තිබීම</u><br>
ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල සම්පූර්ණ වාර්තාව හා වගකීම් සහතිකය කොන්ත්‍රාත්කරු වෙතින් ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබීම, ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට සති 2ක කාලයක් තිබියදී රඳවුම් මුදලින් 88% එනම් රු:35,673,850.00ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබීම, වර්ෂා දිනවලදී ඉහළ මහල්වල ජලය කාන්දු වීම හා අභ්‍යන්තර කාර්යාල පරිශ්‍ර තුලට ජලය ගලාඒම වැනි අඩුපාඩු විගණනයට නිරීක්ෂණය වී ඇත.</td>
<td><u>ගොඩනැගිල්ලේ තාක්ෂණික විගණනයක් සිදු කිරීම.</u><br><br>
මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ පවත්නා අඩුපාඩු හේතුවෙන් ගොඩනැගිලි/ තාක්ෂණික විගණනයක් සිදු කිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යංශය (CECB) වෙතින් ඇස්තමේන්තු කැඳවන ලදී.<br><br>
ඒ සඳහා ලබා දෙන ලද රු.12,458,000.00 (බදු රහිතව) සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයෙකු ගෙන් සමන්විත ඇගයීම් කමිටුවක් පත් කරන ලදී.<br><br>
එම කමිටුව විසින් ලබා දී ඇති වාර්තාවට අනුව මෙම කාර්යය සිදු කර ගැනීම සඳහා උපදේශන ආයතනයක් වෙතින් ඇස්තමේන්තුවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව නිර්දේශ කර ඇති අතර ගොඩනැගිලි/තාක්ෂණික විගණනයක් සිදුකිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමට අදාළ පිරිවිතර සැකසීම සම්බන්ධයෙන් තමාට හැකියාවක් නොමැති බව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් පත් කරන ලද ඉංජිනේරු මහතා විසින් වාචිකව දැනුම් දී ඇත.<br><br>
එසේම 2025.01.01 දින සිට ක්‍රියාත්මක ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.6 අනුව එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා මෙම කාර්යය සිදුකළ නොහැකි බැවින් ගොඩනැගිලි/ තාක්ෂණික විගණනය සිදු කිරීමට මිල ගණන් කැඳවීම සඳහා සැකසිය යුතු තාක්ෂණික කරුණු ඇතුළත් ලංසු ලේඛන පිළියෙල කිරීම ගැටළුකාරී වීම සලකා ඒ පිළිබඳව පළපුරුද්දක් සහිත ඉංජිනේරුවරයෙකු අදාළ ලංසු ඇගයීමේ කමිටුව සඳහා නම් කරන ලෙස අංක DCS/AC/PRO/F03/02-Building/Technical Audit හා 2025.04.01 දිනැති ලිපියක් මගින් මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br><br>
එම අමාත්‍යාංශයේ ඉංජිනේරුවරියගේද රාජකාරී බහුලත්වය හේතුවෙන් මෙම කාර්යය සඳහා සම්බන්ධ විය නොහැකි බැවින් උක්ත කාර්යය</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| | | පිළිබඳව සඳහන් කරමින් මෙම කාර්යය ඉටු කරවා ගැනීම සඳහා ඒ පිළිබඳව දැනුම හා හැකියාව ඇති ඉංජිනේරුවරයෙකු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීමට කටයුතු කරන ලෙස මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක MF1/01/25CEN/EST-18(ii) හා 2025.05.08 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.<br><br>ඒ අනුව මේ සම්බන්ධයෙන් අංක DCS/Admin/MT/Building Audit හා 2025.05.15 හා 2025.06.04 දිනැති ලිපි මඟින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමෙන් පසු මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතුව ඊට අදාළ උපකරණ නොමැති බැවින් එම දෙපාර්තමේන්තුවට ගොඩනැගිලි/තාක්ෂණික විගණනයක් සිදු කිරීමේ හැකියාවක් නොමැති බවත් ගොඩනැගිලි තාක්ෂණික විගණනයක් සිදු කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමට අදාලව මිල ගණන් කැඳවීම සඳහා සැකසිය යුතු තාක්ෂණික කරුණු ඇතුලත් පිරිවිතර ලේඛනයක් සහ BOQ පිළියෙල කොට ඉදිරිපත් කිරීමේ හැකියාවක් පවතින බවත් ගොඩනැගිලි දෙපාතර්මේන්තුවේ නිලධාරින් දන්වා සිටින ලදී.<br><br>පසුව අංක DCS/Admin/MT/14/ALUMINIUM හා 2025.06.20 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීම පරිදි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ 2025.07.01 දින නැවත සාකච්ඡාවක් පවත්වන ලද අතර අනතුරුව 2025.07.07 හා 2025.07.08 යන දෙදින තුළ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ තාක්ෂණික දැනුම සහිත අදාළ නිලධාරින් කණ්ඩායම් වශයෙන් (වාස්තු විද්‍යාත්මක, නිර්මිත, ජල සැපයුම් හා පල්දෝරු විදුලි කාර්මික යන අංශවල නිලධාරින්) පැමිණ ගොඩනැගිල්ලේ පවතින්නාවූ දෝෂයන් සම්බන්ධයෙන් ස්ථානීය පරීකෂාවක් සිදු කර අවශ්‍ය තොරතුරු ලබාගන්නා ලදී.<br><br>ලබා ගන්නා ලද තොරතුරු මත පදනම්ව සේවාදායකයාගේ අවශ්‍යතාවය ඇතුලත් ලේඛනය - Terms of Reference (TOR) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2025.08.04 දිනැතිව ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා එකඟතාවය ලබාදීමෙන් පසු එහි ලංසු ලේඛනයන් පිළියෙල කර ඉදිරිපත් කරන බව වැඩිදුරටත් දන්වා ඇත. තවද එම කාර්යය සඳහා දෙපාර්තමේන්තු කළමනාකරණ ගාස්තු ලෙස රු.150,000.00 මුදලක් එම දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කරන ලෙසත් දැනුම් දී ඇත.<br>ඒ අනුව වැය විෂය අංක 252-01-01-1409-140 යටතේ රු.150,000.00 ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මූ.රෙ 208 යටතේ 2025.11.25 දින පවරාදීමට කටයුතු කරන ලදී.<br><br>මෙම කාර්යට අදාළව උපදේශන ආයතනයක් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන කාර්යය ආරම්භ කිරීම පිණිස ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (උපදේශන) 2007 හි 2.6.3 අනුව දෙපාර්තමේන්තු උපදේශන කමිටුවක් පත් කිරීම සඳහා නිලධාරින්ගේද නම් යෝජනා කරමින් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර මෙම ප්‍රසම්පාදනය සඳහා වියදම් ඇස්තමේන්තුව අනුව පත්කළ යුතු උපදේශන ප්‍රසම්පාදන කමිටුව තීරණය කළයුතු බැවින්, වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයෙන් දන්වන ලදී.<br><br>ඒ අනුව මේ සඳහා අවශ්‍ය පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2026.04.02 දිනැතිව දන්වා ඇති අතර ඊට අදාළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට තොරතුරු තාක්ෂණය සම්බන්ධ පරීක්ෂණ කටයුතු සඳහා අදාළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමටද තවත් අංශය කිහිපයක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට අවශ්‍ය වරලත් ඉංජිනේරුවරුන් ඔවුන් සතුව නොමැති වීම නිසා සිදුකළ නොහැකි බවත්, මීට පෙර අප විසින් වාචිකව දන්වන ලද අර්ධ රාජ්‍ය ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු අගය ඉහළ අගයක් ගත්තද |

උපදේශන ප්‍රසම්පාදන කමිටුව පත්කර ගැනීම සඳහා අදාළ ඇස්තමේන්තු අගය හෝ එයින් 75% ක් පමණ යොදාගැනීම සුදුසු වන බව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2026.04.21 දිනැතිව දන්වා ඇත. බාහිර පාර්ශවයකින් හෝ මෙම කාර්යය සිදු කර ගැනීම සඳහා පත් කළ යුතු උපදේශන කමිටුවක් පත් කිරීමට විධිමත් ඇස්තමේන්තුවක් පිළියෙල කර ගැනීම සඳහා ඉංජිනේරු දැනුම සහිත නිලධාරීන් දෙපාර්තමේන්තුව සතුව නොමැති වීම සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හරහා මෙම කාර්යය කර ගැනීමට උත්සහ කළ ද ඒ සඳහා ඔවුන් සතුව ද වරලත් ඉංජිනේරුවරුන් නොමැති බව දැනුම් දීම නිසා මෙම කාර්යය සිදු කිරීම තව දුරටත් ගැටලුකාරී තත්ත්වයක පවතී. කෙසේ වුවත් ගොඩනැගිල්ලේ පවතින ජල කාන්දුවීම වැනි අඩුපාඩු සැකසීම සඳහා පහත ක්‍රියා මාර්ග ගෙන ඇත.

<u>ජල කාන්දුව වැලැක්වීම සඳහා ගත් පියවර</u>

05 වන මහලේ පිහිටි මිල හා වේතන අංශයේ Concrete Slab හි පැවති ජල කාන්දුවට අදාළ අලුත්වැඩියාව 2025.12.13 අවසන් කර ඇත. අලුත්වැඩියාවට අදාළව Dehumidifier යන්ත්‍ර 02ක් සවි කර ඇති අතර එම යන්ත්‍ර 02 මගින් Concrete Slab හි මතුපිට රැඳෙන ජලය සම්පූර්ණයෙන්ම උරාගැනීම සිදු කෙරේ. අලුත්වැඩියාව සාර්ථකව අවසන් කර ඇත.

01 වන මහලේ සිට 10 වන මහල දක්වා වූ කාන්තා වැසිකිළි වලට සම්බන්ධ නල පද්ධතිය (ජල නල හා මලාපවහන පද්ධතිය) සවිව පවතින Duct Line හි පැවති සිදුරු ඔස්සේ ජල කාන්දුවීම සිදුවූ අතර එහි අලුත්වැඩියා කටයුතු 2025 වර්ෂයේදී සිදු කර අවසන් කරන ලදී.
ගොඩනැගිල්ලේ විදුලි සෝපාන යන්ත්‍ර කාමරය හා ඊට සම්බන්ධ සියලු ප්‍රදේශයනුත් 10 වන මහලේ කෑම කාමරයේ ඉහළ Slab කොටසත් ජල රෝධනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර එහි 90% ප්‍රමාණයක් මේ වන විට අවසන් කර ඇත.

එහි දෙවෙනි අදියර වශයෙන් 06 වන හා 11 වන මහල් වල විවෘත ප්‍රදේශයන්, වායු සමීකරණ සිසිලන ජල ටැංකි පිහිටා ඇති ප්‍රදේශය සහ ගොඩනැගිල්ලේ සියලුම පැති බිත්තිත් ජලරෝධනය කිරීඔ සඳහා ඇස්තමේන්තු ලබා දෙන ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2026.04.27 දිනැතිව දැනුම් දී ඇත.

<u>ගොඩනැගිල්ලේ ඉදිකිරීම පිළිබඳව සහතිකය ලබාදුන් පෞද්ගලික උපදේශන සමාගම විසින් අදාළ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් නිවැරදි සහතිකයක් ලබා දී නොමැති බැවින් එම සමාගම අසාධු ලේඛනගත කිරීම</u> **<u>(Black List)</u>**

මීට අදාලව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙතින් උපදෙස් ඉල්ලා සිටින ලද අතර ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් “උපදේශන සේවා සපයන ආයතන අසාදු ලේඛනගත කිරීම සඳහා විධිමත් මාර්ගෝපදේශයක් මෙතෙක් සකස් කර නොමැති අතර, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතියට යටත්ව අදාළ ආයතනය අසාධු ලේඛනගත කිරීම සඳහා ආයතනික මට්ටමින් විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙසත් සමානාත්මතාවය සහ විනිවිධභාවයෙන් යුක්ත විය යුතු බවටත් ලබා දී ඇත.

ඒ අනුව දෙපාර්තමේන්තු මට්ටමින් විධිමත් පරීක්ෂණයක් පැවත්වීම සඳහා මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සිවිල් ඉංජිනේරු නිලධාරියාගේ සභාපතිත්වයෙන් යුත් හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් සිවිල් හා විදුලි ඉංජිනේරු නිලධාරීන් දෙදෙනෙකු සහ මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරී ඇතුළත් වන ලෙස කමිටුවක් පත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් ලබා දෙන ලද අතර ඒ සම්බන්ධයෙන් එම අංශයන වෙත දැන්වීමට කටයුතු කරන ලදී.

| | | |
|---|---|---|
| | | ඊට අදාළව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් අධ්‍යක්ෂ ඉදිකිරීම් (කලාප 3) සහ විදුලි ඉංජිනේරුවරියක නම් කර ඇති අතර මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති හා කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු නම් කර ඇත. එසේම නීති නිලධාරියෙකු අපගේ දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ආයතනයකින් පත් කර ගැනීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශය වෙතින් වැඩිදුරටත් දන්වා සිටින ලදී.<br>එසේ වුවද මෙම දෙපාර්තමේන්තුව සතුව නීති නිලධාරියෙකු නොමැති බැවින් දැනට නීති නිලධාරින් අනුයුක්තව සිටින ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ නිවාස ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වෙත නීතිමය සහයෝගය ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස 2026.03.23 දිනැතිව දැනුම් දෙන ලදී. ඒ අනුව නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ නීති නිලධාරිගේ සහය ලබා දිය හැකි බව දැනුම් දී ඇත.<br>ඒ අනුව ඉහත නිලධාරින් හා දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඇතුළත් වන ලෙස 2026.05.06 දිනැතිව කමිටුව පත් කර ඇත. |
| 7. | <u>මුද්‍රණ අංශයේ හා පැරණි කාර්යාල පරිශ්‍රයේ පවතින අඩුපාඩු</u><br>දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී මුද්‍රණ අංශය එම ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කිරීමට සැලසුම් කර නොතිබීම සම්බන්ධයෙන් විගණනය කරුණු අනාවරණය කලේය. මුද්‍රණ අංශය දෙපාර්තමේන්තුව පිහිටා ඇති නව ගොඩනැගිලි පරිශ්‍රය වෙත ගෙන ඒමේ හැකියාව සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමසන ලදී. | 16/7 මුද්‍රණ අංශ පරිශ්‍රයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර ඊට අදාළව එම කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඒ අනුව පවත්නා ගොඩනැගිලි 04න් ගොඩනැගිලි 02ක් පවත්නා ආකාරයෙන් එහෙත් වැඩිදුරට සංවර්ධන කරමින් පවත්වාගෙන යාම සඳහා නිර්දේශ කර ඇති අතර එහි දෙමහල් ගොඩනැගිල්ලක බිම් මහලේ මේ වන විට මුද්‍රණ අංශය පවත්වාගෙන යනු ලබන අතර අනෙක් තනි මහල් ගොඩනැගිල්ල අලුත්වැඩියාව සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඇස්තමේන්තු කැඳවා ඇති අතර අලුත්වැඩියාවෙන් පසු ගබඩාවක් ලෙස පවත්වාගෙන යාම සඳහා කටයුතු කරනු ලැබේ.<br>එසේම අනික් දෙමහල් ගොඩනැගිල්ල සහ තනි මහල් ගොඩනැගිල්ල අබලන් තත්ත්වයේ පවතින අතර ඒ හේතුවෙන් එම ගොඩනැගිලි භාවිතයට ගතහැකි තත්වයේ පවතින්නේද යන්න සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් සහිත ආයතනයක් මඟින් පරීක්ෂා කිරීමට කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර ඒ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත අදාල පරීක්ෂාවන් සිදු කරන ලෙස 2026.01.22 දිනැතිව දන්වා ඇති අතර ඊට අදාල ඇස්තමේන්තු මේ වන විට ඉදිරිපත් කර ඇත. ඊට අදාල ගෙවීම් කටයුතු සිදු කිරීමෙන් පසු වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව අදාල ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.<br>මීට අමතරව දෛනික රාජකාරී කටයුතු සිදු කරගෙන යාමේදී බාධාවක් වන ලෙස ගොඩනැගිලිවල සහ පරිශ්‍රයේ පැවති අඩුපාඩු එනම් වහවල්වල, කානු පද්ධතිවල, ගරාජයේ හා ගේට්ටුවල පැවති අඩුපාඩු අලුත්වැඩියා කර යථා තත්ත්වයට පත් කරන ලදී. තවද පරිශ්‍රයේ යම් යම් ස්ථානයන්හි කුණු, අබලි හා අපද්‍රව්‍ය ගොඩගැසී පැවතුනු අතර ඒවා ඉවත් කොට මුද්‍රණ අංශ පරිශ්‍රය පිරිසිදු කිරීමට කටයුතු කරන ලදී.<br>දෙපාර්තමේන්තුව වෙත පත්වීම් ලබා පැමිණි තාක්ෂණික නිලධාරී විසින් ද ගබඩාවේ කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් ලබා දී ඇති අතර එම නිර්දේශ සම්බන්ධයෙන් ද අදාළ ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 489 සඳහා ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉද්රිපත් කරමි.

කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න
අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව